# වැවිලි ආර්ථිකය තුල කුඩා තේ වතු හිමියන් මුහුණ දෙන ගැටලු සහ කුටුම්භ ආර්ථිකය (ගාල්ල දිස්ත්‍රික්කය ඇසුරිනි)

ජී.ඒ.ටී.නිමේෂිකා[1]

තේ වගාව ශ්‍රී ලංකාවේ අපනයන බෝගයන්ගෙන් එකක් වන අතර දළ දේශීය නිෂ්පාදිතයට එහි දායකත්වය 0.9% (2013)කි. මෙසේ ආර්ථිකයට වැදගත් බලපෑමක් දක්වන තේ වගාව තුල කුඩා තේ වතු හිමියන් ගැටලු රාශියකට මුහුණ දී ඇත. ඒ පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා ගාල්ල දිස්ත්‍රික්කයේ තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හිනිදුම බටහිර ග්‍රාම නිලධාරී වසමේ පවුල් සමූහය අතුරින් 20%ක් නියෝජනය වන පරිදි නියැදිය තෝරා ගෙන ඔවුන් තේ වගාව තුල මුහුණ දෙන ගැටලු කුටුම්භ ආර්ථිකයට බලපෑමක් දක්වනවාද යන්න සොයා බැලීම සිදු කරන ලදී. මෙහිදී ග්‍රාමීය ජනතාව තේ වගාව තුලදී මුහුණ දෙන ගැටලුද, එකී ගැටලු කුටුම්භ ආර්ථිකයට බලපෑමක් කරයිද යන්නත්, ඒවා අවම කිරීමට ගත යුතු පිලියම් පිළිබඳව අවධානය යොමු කිරීමත් මෙහි අරමුණු විය. ඒ සඳහා ප්‍රාථමික හා ද්විතියික දත්ත රැස්කළ අතර බහුගුණ ප්‍රතිපායන ආකෘතියක් මගින් දත්ත විශ්ලේෂණය කරන ලදී. එමගින් අනාවරණය වූ පරිදි අස්වැන්න කෙරෙහි තේ ගසේ ආයුකාලය හා යොදන පොහොර ප්‍රමාණයද බලපෑමක් සිදුකරන බව ප්‍රත්‍යයක්ෂ විය. පොහොර ප්‍රමාණය සැලකීමේදී ඵලදායි අස්වැන්නක් නෙළා ගැනීමට මාස තුනකට වතාවක් පොහොර යෙදිය යුතුය. නමුත් කුඩා තේ වතු හිමියන්ට ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවන බැවින් එසේ ක්‍රමවත්ව පොහොර යෙදීමට නොහැකිවීමද අස්වැන්න අඩුවීම කෙරෙහි බලපා ඇත. තවද තේ ගසේ ආයුකාලය සැලකීමේදී සාමාන්‍යයෙන් වසර 20කට පසු නැවත අලුතින් තේ වගා කළ යුතුය. ආයුකාලය ඉක්මවා ඇති තේවලින් ඵලදාව නෙලීමේදී ලැබෙන අස්වනු ප්‍රමාණය අඩුවේ. ඒ අනුව කුඩා තේ වතු හිමියන් පැරණි තේ ශාකවලින් අස්වනු නෙලීම සිදුකරන බව ගම්‍ය විය. වගා කරන ඉඩම් ප්‍රමාණයද තේ අස්වැන්න කෙරෙහි බලපානු ලබයි. මීට අමතරව ස්වභාවික ව්‍යසනද වෙළඳපොළේ මිල උච්චාවචනද කුඩා තේ වතු හිමියන් මුහුණ දෙන තවත් ගැටලු වේ. මේ අනුව නියැදියෙන් 80%ක පිරිසටම තේ වගාව තුල මුහුණ දෙන ගැටලු කුටුම්භ ආර්ථිකය කෙරෙහි බලපෑමක් කරන බව අධ්‍යයනය තුලින් පැහැදිලි විය. මේ සඳහා පොහොර සහනාධාර සහතික මිලක් සහ සහන මිලට නව තේ වර්ග හඳුන්වා දීම විසඳුම් වශයෙන් ඉදිරිපත් කළ හැකිය. මෙය රජයේ ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ හා රාජ්‍ය නොවන සංවිධානවල වගකීම සහ කාර්යභාරය වෙයි.

**මුඛ්‍ය පදඃ**වැවිලි ආර්ථිකය, කුඩා තේ වතු හිමියන්, ආර්ථික ගැටලු

---

[1] සහකාර කථිකාචාර්ය , ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. gatnimeshi@gmail.com